



ආචාර්ය
තරංග චින්තන
දන්දෙනිය

ඕස්ට්‍රේලියාවේ රංග කලාවේ ඉතිහාසය ගැන කතා කරනවානම් එය පටන්ගත යුත්තේ ඇබොරොජිනල් වරුන්ගේ රංග ක්‍රියාවන් ඇසුරෙන්ය. වසර පනස්දහසකටත් ඔබ්බට ඇදී යන මානව අතීතයක, රංග කලාව පිළිබඳ ඉතිහාසය යනු ඩ්‍රීම් ටයිම් හි සිට

නිමිත්තෙන් හිරකරුවන් යොදාගෙන ඉදිරිපත් කළ අයර්ලන්ත ජාතික ජෝර්ජ් ෆර්කුහර් ගේ රිකෘට්මෙන්ට් ඔෆිසර් (Recruitment Officer) (1706) නාට්‍යයි. මේ වේදිකා රංගය පිළිබඳ ඇතැම් විස්තර අනුව එහි ප්‍රධාන ස්ත්‍රී චරිතය රඟපෑ තැනැත්තිය එල්ලා මැරීමේ මරණ දඬුවම ට ලක්වීමට අවස්ථාව තිබු සිරකාරියකි. ආණ්ඩුකාරයාගේ ප්‍රදානත්වයෙන් පවත්වනු ලැබූ මේ රංග කටයුත්තේ ප්‍රේක්ෂකයෝ බහුතරයක් වුයේ එම හිරකරුවන් සහ ඔවුන් බාර නිලධාරින්ය.


BLACK-EYED SUE, and SWEET POLL of PLYMOUTH,
Taking leave of their Lovers who are going to Botany Bay.

# ඕස්ට්‍රේලියාවේ වේදිකා නාට්‍යය

ඥාණනය වූ චාරිත්‍ර පදනම් වූ සංගීතය නැටුම් සහ නිරූපනය මූලික රංග කලාවය. එහෙත්, ඕස්ට්‍රේලියාවේ වේදිකා නාට්‍ය පිළිබඳව කතාකිරීමේ දී, 1778 දී කපිතාන් ආතර් පිලිප් සමග පැමිණි නිළධාරින්, වගාකරුවන්,


By Permiſſion of His Excellency.
FOR THE BENEFIT OF J. BUTLER
AND W. BRYANT.
At the THEATRE, SYDNEY,
On Saturday, July 30, 1796. will be Performed
JANE SHORE.

| | |
|---|---|
| Haſtings | I. Sparrow. |
| Belmour | R. Evans |
| Cateſby | H. Lavell. |
| Ratcliffe | L. Jones. |
| Gloſter | W. Chapman |

ඔවුන්ගේ පවුල්වල ඇත්තන්, සහ ස්ත්‍රී පුරුෂ හිරකරුවන් අතරින් එය ඇරඹුන බව පැවසිය හැකිය

තම පවුල් හෝ කණ්ඩායම් අතරෙහි විනෝදාස්වාදය උදෙසා ඉදිරිපත් කළ රංගයන්ට අමතරව, විධිමත්ව ඉදිරිපත් වූ වේදිකා නාට්‍යය වන්නේ, පළමු නැව් කණ්ඩායමේ ආගමනයෙන් වසරකට පසුව, එනම් 1779 දී, ජෝර්ජ් රජ්ජුරුවන්ගේ උපන්දිනය

පිටුවහල් කළ වැරදි කරුවන් යොදාගෙන නාට්‍ය කිරීම පිළිබඳ රාජ්‍ය සහ මහජන මතය විවිධාකාර විය. විරෝධතාවයක් ලෙස ඉදිරිපත් වූ ප්‍රධාන මතය වුයේ, අපරාධ කිරීම නිසා පිටිවහල් කළවුන් විනෝදාස්වාද ක්‍රියා නැරඹීම සහ ඒවාට සහභාගී වීම

ඔවුන් හට දඩුවමක් නොව අනවශ්‍ය ලෙස සංග්‍රහ කිරීමක් බවය. තවත් කරුනක් වන්නේ, රංග කලාව මිනිස් මනස පෙළඹවීම් වලට ලක් කරණ කලාව සහ අපචාර ක්‍රියා සමග බැදුණ කලාවක් නිසා (ඒ ලෙස සලකා) රංග නැරඹීමෙන් එම පිටිවහලුන් සුරා, සුදු සහ වෙනත් අපරාධ කෙරෙහි තවත් නැඹුරු වීමට හැකියාව ඇති බවයි. එම යුගයේ දී, ප්‍රේක්ෂකයන් ඉහත රංගයන් නැරඹීමේ දී කරණ ලද අවිචාරවත් ප්‍රතිචාර ද ඉහත කී මතවාද තහවුරු කිරීමට වඩාත් හේතුවිය. එබැවින්, රජු විසින්, පිටුවහල් කළ වැරදි කරුවන් හට රංග කලාව නුසුදුසු බව 1794 දී තීරණය කරන ලදී.

එහෙත්, අනෙකුත් මුල් සංක්‍රමණිකයන් සහ දඬුවම් අවසන් කළ පිටුවහලුන් අතර විනෝදාස්වාද මාර්ගයක් ලෙස වේදිකා රංග ක්‍රමයෙන් ජනප්‍රිය විය. මේ කාලයේ දී, එනම් 1796 දී, වැරදිකරුවෙක් ලෙස පැමිණ, සිය දඬුවම් කාලය ගෙවා අවසන්වූ රොබර්ට් සයිඩ්වේ නැමැත්තා විසින් බෙල් රෝ (Bell Row) නමින් ප්‍රථම ස්ථිර රංග ශාලාව ඉදිකරණු ලැබිය. 1976 ජනවාරි 16 වැනි දින විවෘත කළ මෙම රංග ශාලාවේ සිදුකළ පළමු රංගය වුයේ පළිගැනීම (The Revenge ) නම් වූ නාට්‍යයකි. රංගය නැරඹීම සඳහා ගැලරියට එක සිලිමක් සහ ඉදිරිපෙළ වෙන්කළ ආසන සඳහා සිලිං තුනකට වඩා අය කළ ද, මුදල වෙනුවට එම වටිනාකමට සමාන තිරිඟු පිටි, මස් හෝ මත්පැන් වැනි දේ ආදේශක ගෙවීම් ලෙස යොදාගත හැකිවිය. ක්‍රොනිකල් ඔෆ් ඕස්ට්‍රේලියාවේ පොතෙහි එන වාර්තා අනුව, නීති උපදේශක ඩේවිඩ් කොලින්ස් පවසන්නේ එය තරමක සාර්ථක රංගයක් බවයි. එමෙන්ම ඔහු පවසන්නේ, නළුවන්ට වඩා ප්‍රේක්ෂකයන් වැරදි ක්‍රියා කිරීමේ අවදානමක් තිබු බව සහ ගැලරියේ ආසන පනවා තිබු ආකාරය සොරකම් කෙරුමට පොළඹවන ආකාරයක් ලෙස ඔහුට සිතුන බවයි. අනතුර කලින්ම දුටු කොලින්ස් වැඩිදුරටත් කිවේ, සොරකමට අවස්ථා බලමින් සිටිනා වඩාත්ම නරක වර්ගයේ වූ අපරාධකරුවන් මෙම අවස්ථාව තමන්හට පලදාවක් බවට පත්කරගනිමින්, ප්‍රේක්ෂකයන් රඟහලේ සිටින බව ප්‍රත්‍යක්ෂ කර, ඔවුනගේ නිවෙස් බිඳ සොරකම් කළ හැකි බවය. එම අනාවැකිය සැබෑවක් කරමින්, 1796 දී මුලින්ම සිඩ්නි නගරයේ ඉදිකළ එම රංග ශාලාව 1798 දී වසාදමන්නේ, දඬුවම් අවසන් වුවද පෙර චර්යා වෙනස් කර නොගත් ඇතැම් පිටිවහල්ලු, අනෙකුත් ප්‍රේක්ෂකයෝ නාට්‍ය නරඹන අතරතුර ඔවුනගේ මුදල් පසුම්බි සොරකම් මෙන්ම ඔවුන ගේ නිවෙස් බිඳ කළ සොරකම් ඉහළ ගිය නිසාය. ඇතැම්විට, ඩේවිඩ් කොලින්ස් වැනි නීති ක්ෂේත්‍රයේ බලපෑම් කළහැකි වු පුද්ගලයන්, තම පූර්ව මතය මත පිහිටා, රංග ශාලාව වැසීමේ යෝජනාව සම්මත කරගත්තා වියහැකිය. ඇතැම් වාර්තා අනුව රංගශාලාව වසා දමන්නේ 1800 දී ය. එම කාල සීමාව අතරතුර, සයිඩ්වේ විසින් ශේක්ස්පියර් ගේ නාට්‍ය සහ සමකාලීන ඉංග්‍රීසි නිර්මාණ කරුවන්ගේ නාට්‍ය පෙළ නිෂ්පාදනය කළ බව කියවේ.

රඟහල් නැවත විවෘත කිරීමට නැවත අවසර ලැබෙන්නේ 1833 දී ය. ඒ, බර්ක් ආණ්ඩුකාරවරයාගේ අවසරයෙන් සිඩ්නි හි ආරම්භ කරන ලද තියටර් රෝයල් මගින්ය. අලුත සංක්‍රමණය වූ, එම රඟහලේ පසුතල නිර්මාණ කළ ශිල්පියෙකු ගේ දහසය හැවිරිදි දියණිය, එලිසා වින්ස්ටන්ලි තනි චරිතයකින් යුතු රංගයක් තියටර් රෝයල් හි ප්‍රේක්ෂකයින්හට ඉදිරිපත් කරමින් ඕස්ට්‍රේලියාවේ වේදිකා රංගයෙහි නව කඩඉමක් 1834 දී සනිටුහන් කරන්නීය .

මතු සම්බන්දයි